# 多言語情報コーナー　　　　　　　　　（令和６年　５月号）

## 1. ස්ථාවර දේපල බද්ද, නගර සැලසුම් බද්ද, මෝටර් වාහන බද්ද, සැහැල්ලු වාහන බද්ද සහ බදු ගෙවීම් පිළිබද දැනුවත් කිරීම් පිලිබදව

**ජනවාරි පළමුවන දින** වන විට නගරයේ ඉඩම්, නිවාස ආදිය හිමි අය ස්ථාවර වත්කම් බද්දක් ගෙවිය යුතුය. බදු ගෙවීමේ පත්‍රිකා මැයි මස 1 වනදා යවනු ලබන අතර සම්පූර්ණ මුදල සඳහන් පත්‍රිකාව සහ **පළමු වාරය සඳහා ගෙවීමේ කාලය මැයි 31 වන දින වේ.**

මීට අමතරව, **අප්‍රේල් 1** වැනිදා **වන විට 660cc** ට **වැඩි වාහනයක්** හිමි ඕනෑම අයකුට මෝටර් රථ බද්ද ගෙවීමට සිදුවේ. යතුරුපැදි සහ සැහැල්ලු මෝටර් රථ ආදිය හිමි පුද්ගලයන් සැහැල්ලු මෝටර් රථ වාහන බද්ද ගෙවිය යුතුය.සාමාන්‍ය මෝටර් රථ සඳහා ගෙවීමේ පත්‍රිකාව මැයි පළමුවැනිදාද  සැහැල්ලු මෝටර් රථ සඳහා මෝටර් රථ බදු ගෙවීමේ පත්‍රිකාව මැයි මස 2 වැනිදා නිකුත් කරනු ලැබේ.මෙම බදු ගෙවීමේ **අවසාන දිනය මැයි 31** වැනිදා වේ.

ඔබට ගෙවීමේ පත්‍රිකා ලැබුණු පසු , ලියුම් කවරය තුළ ඇති ගෙවීම් පත්‍රිකාව රැගෙන කොම්බිනි වෙළද සැලකින් හෝ බැංකුවකින් හෝ තැපැල් කාර්යාලයකින් ගෙවීම් සිදුකල හැකිය. ඔබට ස්ථාවර දේපල බද්ද සහ සැහැල්ලු මෝටර් රථ බදු ගෙවීමේ අපහසුතාවයක් ඇත්නම් ඒ සදහා නගර ශාලාවේ ඇති බදුගේවීමේ කවුළුව සමග සාකච්චා කිරීමට හැක. මෝටර් රථ වාහන බද්ද යනු තොචිගි ප්‍රාන්තයට ගෙවන බද්දකි. ඒ සදහා කරුණාකර කන්දා  නගරයේ ෂිමොට්සුගා රජයේ ගොඩනැගිල්ලේ 1 වන මහලේ පිහිටි ප්‍රාන්ත බදු කාර්යාලයෙන් විමසීම් සිදුකල හැකිය.

ඔබ ජපානයේ රැඳී සිටින කාලය අලුත් කිරීමට අවසර දීම සම්බන්ධයෙන් තීරණය කිරීමේදී  ඔබ ඔබේ බදු වගකීම් නිසි ලෙස ඉටු කර තිබිය යුතුය වන අතර  එය අවසරය ලබා දීම සඳහා සලකා බැලිය යුතු සාධකයක් වනු ඇත. ඔබ බදු පහරහැරීමක් සිදුකර ඇත්නම් ඔබට වීසා අලුත් කිරීමේ අවසරය ලබා නොදීමට ඉඩ ඇත, එබැවින් නියමිත දිනට බදු ගෙවීමට වග බලා ගන්න.

## 2. ඒක පුද්ගල නේවාසික බද්දට පමණක් යටත් වන කුටුම්භ සඳහා තාවකාලික ආධාරක ප්‍රතිලාභ සහ අඩු ආදායම්ලාභී දරුවන් ඇති දැඩි කරන කුටුම්භ සඳහා ලබාදෙන සහාය පිළිබඳව

ඉහළ යන බලශක්ති සහ ආහාර මිල නිසා ඇති වන අපහසුතා අඩු කර ගැනීම සඳහා, මේ අනුව 2023 දී අඩු ආදායම්ලාභී ඒක පුද්ගල නේවාසික බද්ද පමණක් ගෙවනු ලබන නිවාස ලාභීන්ට යෙන් 100,000 ලබා දීමෙන් එම පවුල් සඳහා රජය සහාය වනු ඇත.

දැනටමත් ගෙවීම් අවශ්‍යතා තහවුරු කිරීම සඳහා අප්‍රේල් මුල පමණ සුදුසුකම් ලත් පුද්ගලයින් වෙත යවා ඇත.
කරුණාකර අවශ්‍ය ලියකියවිලි ආපසු ලියුම් කවරයේ දමා **ජූනි 28 වනදාට පෙර** නැවත ආපසු එවිය යුතුය.

ඊට අමතරව, ඒක පුද්ගල නේවාසික බද්දට පමණක් යටත් වන අඩුආදායම් ලාභී ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ඇති කුටුම්භ අතර**, 2005 අප්‍රේල් 2 සහ 2024 අගෝස්තු 31 අතර උපත ලද වයස අවුරුදු 18** ට අඩු දරුවන් සිටින කුටුම්භ සඳහා. පුද්ගලයෙකුට යෙන් 50,000 ක දීමනාවක් ලබා දෙනු ඇත.

මාර්තු අග වන විට තහවුරු කර ඇති අය සඳහා, ගෙවීම් අවශ්‍යතා තහවුරු කිරීමට අදාල පෝරම අප්‍රේල් මස මුලදී ලැබෙන පරිදි යවනු ලැබේ. කරුණාකර අවශ්‍ය ලියකියවිලි ආපසු ලියුම් කවරයේ දමා **සැප්තැම්බර් 17 වනදාට පෙර** ආපසු එවන්න.

විමසීම් සඳහා, කරුණාකර තොචිගි නගරයේ තාවකාලික ප්‍රතිලාභ ඇමතුම් මධ්‍යස්ථානය වන දුරකථන අංක **0282-21-2416** අමතන්න.

**3. මයි නම්බර් කාඩ්පත සඳහා යොදවා ඇති ඉරිදා කවුන්ටරය පිළිබඳ තොරතුරු**

රැකියාව හෝ පාසල් කටයුතු හේතුවෙන් සතියේ දිනවල ඒ සඳහා කාර්යාලයට පැමිණිය නොහැකි පුද්ගලයින් සඳහා, අපි මසකට වරක් ඉරිදා කවුන්ටරයක් විවෘත කරනු ලැබේ.

ඔබට මෙම සේවාව භාවිතා කිරීමට අවශ්‍ය නම් කරුණාකර දුරකථනයෙන් අයදුම් කිරීමට සිදුවේ.එම සේවාව ලබාගැනීමට අපේක්ෂා කරන දිනයේ සිට මාස දෙකකට පෙර මස පළමුවනදා සිට  අයදුම් කළ හැක. උදාහරණයක් ලෙස, අගෝස්තු මාසයේ ඉරිදා කවුළුව සඳහා අයදුම්පත් ජූනි 1 සිට වෙන් කරවා ගත හැකිය.

මෙම සේවාව සෑම මසකම දෙවන ඉරිදා උදේ **8:30 සිට 12:00** දක්වා ලබාගත හැක.
ස්ථානය නගර ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ 2 වන මහලේ ඇති පුරවැසි ජීවිත අංශය වන අතර ඔහිරා , ෆුජිඕකා  , සුගා , නිශිකතා සහ ඉවෆුනේ  යන ප්‍රදේශවල ජීවත් වන අය සඳහා, ප්‍රදේශයේ සාමාන්‍ය ශාඛා කාර්යාලයේ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවර්ධන අංශය වේ.උදාහරණයක් ලෙස, ඔබගේ ලිපිනය තොචිගි ප්‍රදේශයේ නම්, කරුණාකර නගර ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පුරවැසි ජීවිත අංශය වන අතර භාවිතා කරන්න, ඔබ ඔහිරා ප්‍රදේශයේ නම්, කරුණාකර ඔහිර සාමාන්‍ය ශාඛා ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවර්ධන අංශය හා සම්බන්ද වන්න.

මෙහිදී ලබාගතහැකි සේවාවන් ලෙස මයි නම්බර් කාඩ්පත් ලබා ගැනීම, රහස්‍ය අංකය නැවත සැකසීම, විද්‍යුත් සහතික නිකුත් කිරීම සහ අලුත් කිරීම, නම් වෙනස් කිරීමේදී හෝ ගමන් කිරීමේදී කාඩ්පතේ මුහුණත යාවත්කාලීන කිරීම සහ රැඳී සිටින කාල සීමාවේ වෙනස්වීම් හේතුවෙන් වලංගු කාලය වෙනස් කිරීම ඇතුළත් වේ. ආදිය.

මෙහිදී මයි නම්බර් කාඩ්පත් අයදුම් කිරීම සිදුකරනු නොලැබේ.

දිනකට තීරණය කර ඇති සීමාවට පැමිණීමෙන් සේවාව අවසන් කරනු ලැබේ.

## 4. ළමා ආපනශාලා පිළිබද

ඔබ කොදොමෝ ශෝකුදෝ (දරුවන් ගේ ආපන ශාලා )ගැන දන්නවාද?

ළමා ආපන ශාලාවක් යනු ප්‍රදේශයේ දරුවන්ට මනසේ සාමයෙන් කාලය ගත කළ හැකි ස්ථානයක් ලෙස ආහාර, ක්‍රීඩා, ඉගෙනුම් ආධාර ආදිය සපයන ප්‍රජාවකි. එය ක්‍රියාත්මක වන්නේ ප්‍රදේශවාසීන්, NPO සංස්ථා, සමාජ සුබසාධන සංස්ථා යනාදිය විසිනි.

තොචිගි ප්‍රදේශයේ , "Tochikkokage" තොචිගි කොගගේ නමින් ළමා අවන්හලක් ඇත. එය සෑම මසකම තුන්වන සෙනසුරාදා පෙ.ව. 11 සිට පස්වරු 3 දක්වා කිරාරා නෝ මෝරි, ඉරිෆුන් නගරයේ තොචිගුරා නගරයේ රකුෂුකාන්ති ගොඩනැගිල්ලේ දී පැවැත්වේ.

ඔහිරා ප්‍රදේශයේ "ළමා කැෆේ මින්නා නො කි" නමින් ළමා ආපන ශාලාවක් ඇත. මෙය සෑම මසකම පළමු සෙනසුරාදා සවස 4:00 සිට 7:00 දක්වා ඔහිරා නගරයේ තොමිතාහි ඔහිරා (බටහිර ) නිෂි දිස්ත්‍රික් ප්‍රජා මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

මීට අමතරව, (Tsuga, Iwafune සහ Fujioka) ෆුජිඕකා , සුගා , නිශිකතා සහ ඉවෆුනේ ප්‍රදේශ ආදියේ නගරයේ ළමා ආපනශාලා ඇත. සෑම සේවාවක්ම ළමයින්ට සහ ඔවුන්ගේ භාරකරුවන්ට භාවිතා කළ හැකි අතර, පිරිවැය ළමුන් සඳහා යෙන් 100 ක් සහ වැඩිහිටියන් සඳහා යෙන් 300 ක් පමණ මුදලක් වේ.

ළමා ආපනශාලාව ඕනෑම කෙනෙකුට භාවිතා කළ හැකිය. විදේශීය පදිංචිකරුවන් ද ඉතා සාදරයෙන් පිළිගනීයි , එබැවින් ඔබගේ ප්‍රදේශ අසල ළමා ආපනශාලාවක් තිබේ නම්, එය භාවිතා කර බලන්න !